**කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------------**

**1 .** **මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**---------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) කොම්පෝස්ට් භාජන හා පරිගණක උපාංග සඳහා පිළිවෙලින් වැය කර තිබූ රු.189,976 ක් හා රු.243,304 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි රු.433,280 කින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) 2014 වර්ෂයේදී සභාව වෙත ලැබී තිබුණු ගැල්වනයිස් බට 188 ක වටිනාකම රු.208,143 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2016 මාර්ග සතිය වෙනුවෙන් 2017 වර්ෂයේදී ලැබී තිබුණු රු.2,816,402 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ප්‍රධාන මුදල් පොතට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.4,867,258 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල රු.4,644,670 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු.222,588 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සභාවේ ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් රු.110,775 ක් වැඩියෙන් ලැබීම හේතුවෙන් වර්ෂයේ ආදායම් එම වටිනාකමෙන් වැඩියෙන් දැක්වුණි.

(උ) 2017 මාර්ග සතිය යටතේ සංවර්ධිත මාර්ගයන්හි බිල්පත් ගෙවා තිබියදී ණයහිමියෝ ලෙස රු.584,305 ක් දක්වා තිබුණි.

(ඌ) සභාව සතු බදු දේපල 13 ක වාර්ෂික ආදායම රු.3,445,566 ක් වුවත් එය ආදායම වියදම් ගිණුමේ රු.2,202,767 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ආදායම් රු.1,242,799 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

--------------------

ගිණුම් විෂයයන් 02 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා උපයෝගී ලේඛනවලට දැක්වෙන ශේෂයන් අතර රු.43,301 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.79,965 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

වර්ෂ ගණනාවක සිට පැවත එන එකතුව රු.630,941 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.71,510,558 ක් වූ ගිණුම් විෂයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

-------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික අනියම් සේවකයන්ගේ සේවය අවසන් කළ විට ඔවුන්ට පාරිතෝෂිත ගෙවීම් සඳහා වූ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 1995 ජනවාරි 29 දිනැති පළාත් පාලන චක්‍රලේඛ අංක 1/95 | වගකිවයුතු නිලධාරීන් කිසිවෙකුගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,687,482 ක් වූ අතර ඊට **ප්‍රති**රූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,129,923 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් වර්ගය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වටිනාකම | 2017 වර්ෂයේ බිල්කල ආදායම වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017.01.01 හිඟයෙන් වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017 බිල්කළ මුදලින් වටිනාකම | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම වටිනාකම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යාපාර හා කර්මාන්ත බදු | - | 210,000 | - | 265,800 | - |
| උසාවි දඩ | 1,041,473 | 593,490 | - | - | 1,634,963 |
| මුද්දර ගාස්තු | 1,073,450 | - | - | - | 1,073,450 |
| කසල බදු | - | 300,000 | - | 254,600 | - |
| වෙළඳ බලපත්‍ර | - | 350,000 | - | 265,740 | - |
| කඩකුලී | 82,202 | 876,000 | - | 883,000 | 82,202 |
| බදුකුලී | 589,084 | 3,488,900 | 397,150 | 1,767,394 | 241,823 |
| එකතුව | 2,786,209 | 5,818,390 | 397,150 | 3,436,534 | 3,032,438 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

---------------------------------------

සභාවේ ලේකම්වරයා ලබාදුන් ආදායම් රැස් කිරීමේ කාර්යසාධන වාර්තාව අනුව 2017 ජනවාරි 01 දිනට බදු කුලී රු.589,084 කින් රු.397,150 ක්ද, වර්ෂයේ බිල්කළ බදුකුලී රු.3,488,900 කින් රු.1,767,394 ක් සමාලෝචිත වර්ෂය තුළ රැස් කරගෙන ඇති බව දක්වා තිබුණු අතර වර්ෂය අවසානයේ තවදුරටත් අයකළ යුතු හිඟ බදුකුලී වටිනාකම රු.241,823 ක් ලෙස දැක්වීමෙන් ලේකම්වරයා ලබාදුන් ආදායම් රැස් කිරීමේ කාර්යසාධන වාර්තාවේ දක්වා ඇති වටිනාකම් සවදා බව නිරීක්ෂණය විය.

2.2.3 වරිපනම් හා බදු

------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(i) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණුකල ප්‍රදේශවල පිහිටි නිශ්චල දේපලක හෝ නිශ්චල දේපල වර්ගයක වාර්ෂික වටිනාකම පාදක කරගෙන වරිපනම් බදු අයකළ යුතු වුවත් සභා බල ප්‍රදේශයේ පිහිටි වැඩිදියුණු කළ ප්‍රදේශයන් හඳුනා ගෙන පනතේ උපදෙස් ප්‍රකාරව වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 බදුකුලී

-------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.241,823 ක් වූ හිඟ බදුකුලී ශේෂය තුළ 2013 වර්ෂයට අදාල රු.29,600 ක් හා 2014 වර්ෂයට අදාල රු.112,334 ක් ඇතුලත්ව තිබුණද එම ශේෂ අයකර ගැනීමට 2018 අගෝස්තු වන විටත් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මුද්දර ගාස්තු ආදායම ඇස්තමේන්තු කර නොතිබුණ අතර වර්ෂය ආරම්භයේ පැවති මුද්දර ගාස්තු වලින් රු.1,073,450 ක් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් අයකර ගැනීමට තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

-----------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ සඳහන් කාරණා ඉටුකිරීම සඳහා පළාත් සභාව විසින් පනවා තිබෙන අතුරු ව්‍යවස්ථා 10 ක් 2018 ජනවාරි 26 දිනැති අංක 2056 අති විශේෂ ගැසට් නිවේදනය යටතේ ප්‍රාදේශීය සභාව වැළඳගෙන තිබුණ නමුත් එම අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) ඉටුනොකළ කර්තව්‍යයන්

------------------------------

සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂයේදී සංවර්ධන ව්‍යාපෘති 24 ක් සඳහා රු.2,125,969 ක ප්‍රතිපාදන ලැබී තිබුණ නමුත් එම ව්‍යාපෘති 2018 ජුනි 30 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සභාව විසින් රැස්කරනු ලබන කැලි කසළ වලින් දිරාපත් නොවන අපද්‍රව්‍ය රජයට අයත් භූමියකට බැහැර කර තිබුණි. එම කැලි කසළ පරිසරයට නිරාවරණය වීමෙන් ප්‍රදේශවාසීන්ට සෞඛ්‍ය ගැටළුවලට මුහුණ දීමට සිදුවිය හැකි බව හා දිරාපත් නොවන ද්‍රව්‍ය පරිසරයට මුදාහැර දහනය කිරීමෙන් පාරිසරික හානි සිදුවන බවත් නිරීක්ෂණය විය.

(ඉ). තිරසර සංවර්ධන ඉලක්ක

----------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සුසාන භූමි 44 ක්, ඉඩම් 13 ක් හා ගොඩනැගිලි සහිත ඉඩම් 04 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වෙත ලබාදී තිබුණු රු.97,429 ක් වටිනා ගැල්වනයිස් බට 88 ක් ආපසු සභාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1994 වර්ෂයේ සිට පැවත එන කඩ කාමර 05 ක් සඳහා අයවිය යුතුව පැවති රු.82,202 ක හිඟ කඩකුලී ශේෂය කපාහැරීම සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා 2014 පෙබරවාරි 21 දින යවා ඇතත්, 2018 අගෝස්තු 30 දින වන විටත් එම අනුමැතිය ලැබී නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

අනුමත කාර්ය මණ්ඩලය 39 ක් ලෙස දක්වා තිබුණු අතර එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 21 ක් වූයෙන් සේවක පුරප්පාඩු 19 ක් සහ අතිරික්ත මුරකරුවෙකු විය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

සභාව සතුව වාහන 15 ක් පැවතියද ස්ථිර එක් රියදුරුකු සහ අනියම් රියදුරුකු සේවයේ යෙදවීම නිසා සභා කටයුතු සඳහා වාහන, අවශ්‍ය ධාරිතාවයෙන් යුක්තව භාවිතා කළ නොහැකිව තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

-------------------------------

3.5.1 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

ඌන උපයෝජිත වත්කම්

-----------------------------

සභාව භාරයේ පවතින වාහන 06 ක් සමාලෝචිත වර්ෂය තුළ සේවයේ යොදවා නොතිබුණි.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

ආදායම් විෂයයන් 05 ක ඇයවැයගත ආදායම හා තත්‍ය ආදායම් අතර සියයට 12 සිට සියයට 117 දක්වා වූ පරාසයක විචලනයන් හා වියදම් විෂයයන් 06 ක ඇයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 17 සිට සියයට 99 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

----------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ 2016 මැයි 11 දිනැති NCP/CS/01/විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

**-----------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නඩත්තු නොකිරීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | (i) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම.<br>(ii) භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුනොකිරීම. |
| **(ඇ)** | සේවක කළමනාකරණය | (i) සංවිධානය සටහන සකස් කර අවශ්‍ය සේවක මණ්ඩල නිශ්චය නොකිරීම.<br>(ii) පත්වීම් ලද තනතුරේ නිලධාරීන් සේවයේ නොයෙදවීම.<br>(iii) පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබීම. |